බිංගිරිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3.3, 1.3.5 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ රු.2,878,090 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට උසාවි දඩ හා මුද්දර ගාස්තු ණයගැති ගිණුම බැර කිරීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු.2,878,090 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ලැබිය යුතුව පැවති රු.1,443,052 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම 2012 වර්ෂයේ ඉටුකළ කර්මාන්ත 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද රු.2,107,951 ක මුදල වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියන් සඳහා ගැලපීම් සිදු කිරීමේදී ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගත කල යුතු රු.9,152,744 ක මුදලක් ජ'නල් සටහන් 59 මගින් ප්‍රාග්ධන වැය ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14) අනුව 2013 පෙබරවාරි මාසයට අදාලව ණය හිමියන් සඳහා ගෙවා තිබූ රු.1,348,362 ක මුදලක් ණයහිමි ලෙජර් ගිණුම හර කිරීම වෙනුවට එම ගිණුමට බැර කර තිබීම හේතුවෙන් වර්ෂය අවසානයට ණය හිමියන් රු.2,696,724 කින් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම ලෙජර් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ සැපයුම් හා උපකරණ වියදම

රු.1,467,923 ක් වුවද, එය ආදායම් හා වියදම් ගිණුමෙහි රු.467,923 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.1,000,000 ක් අඩුවෙන්දක්වා තිබුණි.

(ඊ). 2013 වර්ෂයට අදාල රු. 173,314 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල සඳහා වූ දායක මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත නොකර ආදායම් ණයගැතියන් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම රු.173,314 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, ආදායම් ණය ගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු හිඟ මුදලින් රු.210,123 ක් එම අරමුදල විසින් අයකර ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල ගැලපීම් සිදුකර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු සම්පූර්ණ ශේෂය ලෙස ණය හිමියන් යටතේ රු.4,031,914 ක් දැක්වීම හේතුවෙන් ණය හිමියන් රු.210,123 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ). 2013 මැයි මාසයට අදාල රු.135,173 ක සේවක ණය අයවීම්, සේවක ණය ලෙජර් ගිණුම බැර කිරීම වෙනුවට එම ගිණුම හරකර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.270,346 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ). වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය වෙනුවෙන් ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු එකතුව රු.2,054,173 ක මුදල සමුච්චිත අරමුදලට ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව හිග ආදායම්, ඉදිරියට කළ ගෙවීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 11 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු.11,354,048 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල හර ශේෂ එකතුව රු.1,667,205 ක් විය.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.50,848,192 ක් වූ අතර, ඒයින් රු. 41,643,874 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.46,715,467 ක් වූ අතර, ඒයින් රු. 43,780,075 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 38,927,627 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.10,120,509 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,499,269 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,378,760 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.13,892,809 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.39,376,931 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාලව ඌණතාවය රු.15,363,613 ක් විය.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්ථන ආදායම වූ රු.59,545,450 කින් සියයට 77ක් වූ රු.46,211,692 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.13,892,809 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්ථන වියදම වූ රු.49,424,941 න් සියයට 48 ක් ලෙස රු.23,845,910 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 72 ක් ලෙස රු.17,144,021 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.39,376,930 න් සියයට 39ක් ලෙස රු.15,475,000 ක් පමණක් සභා අරමුදල් වැය වී ඇති අතර ඉතිරි සියයට 61 ක් වූ රු.23,901,930 ක ප්‍රමාණය පළාත් නිශ්චිත මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන මත ඉටුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 <u>කාරක ප්‍රාග්ධන කළමනාකරණය</u>

සභාව සතු බැංකු ගිණුමකට අදාලව මාස 06 සිට වසර 05 දක්වා කාලය ඉක්මවා ඇති රු.170,450 ක් වටිනා නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 43 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම් සඳහා නෛතික විධිවිධාන පනවා නොමැති වුවද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම එවැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.4.2 බදු කුලී

සභාවට අයත් වෙළඳ සංකීර්ණ දෙකෙහි කඩ කාමර 02 කට අදාලව රු.19,881 ක හිඟයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවතුණි. එමෙන්ම වාර්ෂික බදුදීම් යටතේ අවම ලංසුව රු.87,547 ක් වටිනා වත්කම් 6 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදීමට නොහැකි වී තිබුණි.

2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,108,916 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.450,000 ක් වටිනා සුභසාධන කාර්යයන් 05 ක් හා රු.1,650,000 ක් වටිනා සභා කර්මාන්ත 06 ක් ඉටුකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල සභාවේ දේශපාලන අධිකාරිය 2013 ඔක්තෝබර් 14 සිට 22 දක්වා වූ කාලය තුල චීනය හා තායිලන්ත සංචාරයක යෙදී ඇති අතර ඒ වෙනුවෙන් රු.413,028 ක් සභා අරමුදලින් දරා තිබූ අතර, රු.52,448 ක වැඩිපුර ගෙවීමක්ද නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වීරපොකුණ සතිපොළ 2012 වර්ෂයේ බදුදීමට අදාලව පැවති රු.309,117 ක හිඟයක් හා 2013 වර්ෂයේ බදුදීමට අදාලව පැවති රු.285,750 ක හිඟයන් සඳහා නඩු පැවරීමට අදාල ගොනු 2013

ජුනි 20 දින නීතිඥවරයාට භාරදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එන්තර වාසි නිකුත් කිරීම පමණක් සිදුව තිබුණි.

3.3 අවිධිමත් ගණුදෙනු

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද රු.500,000 ක ප්‍රතිපාදන මත සභාව විසින් පෙර පාසල් උපකරණ මිලදී ගැනීමේදී සැලකිල්ලට ගත් පිරිවිතර හඳුනාගත නොහැකි වූ අතර, මිළ ගණන් කැඳවා නොතිබූ ළමා අල්මාරි සඳහා මිළ ගණන් ඉදිරිපත් වීම හා එකී භාණ්ඩ මිළදී ගැනීමට තීරණය කිරීම විගණනයේදී ප්‍රශ්නගත විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛණය අනුව රු.65,646,197 ක පුනරාවර්තන ආදායමක් හා රු.56,000,000 ක ප්‍රාග්ධන ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, ප්‍රාග්ධන ආදායම් යටතේ සියයට 11 ක් ලෙස රු.5,992,809 කට පමණක් ළගාවී තිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). මූල්‍ය පාලනය
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය